AAT SRI LANKA

ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීමේ නිවේදනය

# 2025 වර්ෂය සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම

## ලොව දෙවන විශාලතම ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ ශිෂ්‍යයෙකු වීමේ අභිමානය අත් විඳිමින් ඔබේ සිහිනයට පියාපත් දෙන්න..!

2024 නොවැම්බර් 26

**දයාබර ශිෂ්‍යය,**

AAT ආයතනයේ ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචිව වෘත්තීය ගණකාධිකරණ ක්ෂේත්‍රයේ ඉදිරියට පියමං කරන්නට ශ්‍රද්ධාන්විතව තීරණය කළ ඔබට අපගේ ස්තූතිය පුදකරන අතර දේශීයව මෙන්ම විදේශීයව පිළිගත් AAT සුදුසුකම සම්පූර්ණ කර අවසන් විභාගය සමතෙකුව (PF) **NVQ 5 සහිත ඩිප්ලෝමාධාරියකු වීමේ** ජයග්‍රහණය කරා ඉක්මණින් පියමනින්නට අපි ඔබට ආරාධනය කරමු. AAT විභාග සම්පූර්ණ කරන තුරු ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචිය සක්‍රියව පවත්වාගත යුතු බව කරුණාවෙන් සළකන්න.

ඔබේ මුල් ශිෂ්‍ය ලියාපදිංචිය එම ලියාපදිංචි වූ වර්ෂයට පමණක් වලංගු වන අතර ඉන් පසු එය වාර්ෂිකව අලුත් කළ යුතුය. ඔබ දැනටමත් දන්නා පරිදි, ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කරන සිසුන්ට පමණක් AAT විභාග සඳහා අයදුම් කිරීමට, විභාග වලින් නිදහස් වීම සඳහා අයදුම් කිරීමට, ආයතනයෙන් ලිපි ගණුදෙණු සිදුවීමට සහ වෙනත් වරප්‍රසාද හිමි කර ගැනීමට හැකිවේ.

**AAT** සමග ඇරඹූ ඔබේ ජයග්‍රාහී ගමන අවසන් විභාගය සමතෙක් (PF) වනතුරු ක්‍රියාකාරීව පවත්වා ගනිමින් NVQ සහතිකලත් ඩිප්ලෝමාධාරියෙකු (Diploma) වන්න. AAT සිසුන් නිරන්තරව සනාථ කරන පරිදි උසස් පෙළ විභාගයෙන්ද අති විශිෂ්ට ප්‍රතිඵල ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශ අවස්ථා වර්ධනය කර ගනිමින් මෙන්ම AAT අවසන් සුදුසුකම හරහා විවිධ උපාධි සහ පශ්චාත් උපාධි (Degrees and MBAs) අත්පත් කර ගැනීමේ වරප්‍රසාද භුක්ති විඳිමින් අධ්‍යාපන ගමනේ දිදුලන දක්ෂයෙකු වීමට ඔබට පුළුවන. “MAAT” උපාධි නාමයට උරුමකම් කියමින් ඉතාම ලාබාල වෘත්තීය සාමාජිකයෙකු සහ ඉක්මණින් රැකියා නියුක්ත වෙමින් පිළිගත් තරුණ ගණකාධිකාරීවරයෙකු වශයෙන් නොනවතින සාර්ථක වෘත්තීය මගකට පිවිසීමට ඔබට අවස්ථාව හිමි වේ.

**2024 ට අදාළ ලියාපදිංචිය අලුත් කිරීමේ අවසන් දිනයට පෙර 2024 සඳහා ලියාපදිංචිය අලුත් කර**

**වටිනා ත්‍යාග දිනූ වාසනාවන්ත සිසුන් 6 දෙනා**

| | | |
|---|---|---|
| **H.A.S.D. හෙට්ටිආරච්චි**<br>3721353<br>**කුරුණෑගල** | **G.L.A.M. ෂිෆා**<br>3869116<br>**කොළඹ** | **M.N.M. අම්සාල්**<br>2906980<br>**මාතර** |
| **H.A.S. හේෂාන්**<br>3774649<br>**කොළඹ** | **A.G.A. මධුවන්ති**<br>3297476<br>**කොළඹ** | **M.M.A. අහමඩ්**<br>3463017<br>**ත්‍රිකුණාමලය** |

**මෙම වාසනාවන්ත ත්‍යාගලාභීන් අතරට ඔබේ නමත් එක් කරගන්න... දැන්ම 2025 වසර සඳහා ලියාපදිංචිය අලුත් කරන්න.**

## ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම සඳහා උපදෙස්

| | |
|---|---|
| **ගාස්තුව** | **රු. 2,250/=**<br>(පහත සඳහන් දිනට පසු ගෙවන්නේ නම් රු. 500/-ක දඩ මුදලකට යටත්ව රු. 2,750/- ක් ගෙවීමට සිදුවනු ඇත). |
| **අවසන් දිනය** | **2024 දෙසැම්බර් 30** |
| **ගෙවීම් ක්‍රම** | |
| **පළමු ක්‍රමය**<br>[HNB] | හැටන් නැෂනල් බැංකුවේ [HNB] ඕනෑම ශාඛාවක්.<br>**ගෙවීම් වවුචර** : ඉහත බැංකු වල තබා ඇති සාමාන්‍ය මුදල් තැන්පතු පත් භාවිතා කළ යුතුය. [**CDM යන්ත්‍ර හරහා ගෙවීම් කිරීමෙන් වළකින්න**]<br>**ගිණුම් අංකය** : HNB – 039020327099<br>**ගිණුම් හිමියාගේ නම** : AAT ශ්‍රී ලංකා |
| **ගෙවීම් යොමු අංකය** | **“44”** මුලින් යොදා **අංක 7කින් යුත් ඔබේ ශිෂ්‍ය ලියාපදිංචි අංකය** නිවැරදිව සඳහන් කළ යුතුය. (උදා : 44×××××××)<br>(මෙම අංක 07කින් යුත් **ශිෂ්‍ය ලියාපදිංචි අංකය** ඔබේ ශිෂ්‍ය හැඳුනුම්පතේ මෙන්ම මෙම ලිපිය එවන **ලියුම් කවරයේ ඔබේ නම ඉදිරියෙන් ද සඳහන් කර ඇත.**) |
| **දෙවන ක්‍රමය**<br>[Online] | www.aatsl.lk වෙබ් අඩවියට පිවිස online payment යටතේ ඇති “instructions for existing students’ renewal - online” උපදෙස් අනුගමනය කොට online හරහා ගෙවීම. **මෙම ගෙවීම් ක්‍රමයේදී ද ඉහත සඳහන් ගෙවීම් යොමු අංකය නිවැරදිව සඳහන් කළ යුතුය.** |

ඉහත යොමු අංකය සඳහන් නොකළහොත් හෝ වැරදියට සඳහන් කළ හොත් ඔබේ ගෙවීම ප්‍රතික්ෂේප වීම හෝ ඔබේ මුදල් අන් අයකුගේ ගිණුමකට බැර වීම සිදුවිය හැක. එබැවින් ඒ පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන්න.

## ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීමේ පියවර

ඔබගේ ශිෂ්‍යභාවය අලුත් කිරීම සඳහා ඔබ කළයුතු වන්නේ **අදාළ දිනට පෙර ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව නිවැරදිව ගෙවීම පමණි.** මෙසේ ඔබගේ යොමු අංකය නිවැරදිව සඳහන් කර අදාළ ලියාපදිංචිය අලුත් කිරීමේ මුදල තැන්පත් කළහොත්, **ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම දින 03ක් වැනි කාලයක් තුළ සිදුවනු ඇත. (ඔබේ AAT ශිෂ්‍ය හැඳුනුම්පත හෝ ගෙවීම් පිටපත අප වෙත එවීමට අවශ්‍ය නොවේ.)**

ලියාපදිංචිය අලුත් කිරීම අප තොරතුරු පද්ධතියේ යාවත්කාලීන වී දින 3 ක් ඇතුළත ඔබ වෙත SMS පණිවිඩයක් ලැබෙනු ඇත.

## ඒඒටී සමඟ ඔබේ අනාගත ගමන් මග

01 - ඒඒටී ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම

02 - ඒ.ඒ.ටී. අදියර I, අදියර II සහ අදියර III සහ BC විෂය සම්පූර්ණ කිරීම / ඒඒටී අවසන් විභාගය සමතෙකු [PF] බවට පත්වීම

03 - වසරක වෘත්තීය පුහුණුව/ අත්දැකීම් සමග පුද්ගල හා නායකත්ව පුහුණු වැඩමුළුව සම්පූර්ණ කිරීම

04 - සාඩම්බර AAT සාමාජිකත්වය [MAAT]

විෂය හෝ අදියර නිදහස් වීම් සමග වෙනත් වෘත්තීය විභාග සහ උපාධි ඉතා කෙටි කාලයක් ඇතුළත සම්පූර්ණ කිරීමේ අවස්ථා

AAT ව්‍යාපාරික පාසල හරහා උසස් අධ්‍යාපන පාඨමාලා / උසස් ඩිප්ලෝමා පරිගණක සහ කළමනාකරණ සංවර්ධන පාඨමාලා උපාධි මංපෙත්

## වෙනත් වෘත්තීය සහ අධ්‍යාපනික සුදුසුකම් වෙත ඔබේ ගමන් මග

[AAT අවසන් අදියර සමතුන් හට වෙනත් පාඨමාලාවන්හි ලැබෙන විෂය / අදියර නිදහස් වීම්]

| වෘත්තීය ආයතනය | විෂය/අදියර නිදහස් වීම් |
|---|---|
| AAT Business School | Higher Diploma in Accounting & Finance (HDAF) පාඨමාලාවෙහි පළමු වසර සම්පූර්ණයෙන් නිදහස්වීම |
| CA Sri Lanka | ව්‍යාපාර I අදියර සම්පූර්ණයෙන් නිදහස්වීම<br>ව්‍යාපාර II අදියරෙහි විෂයයන් දෙකක් නිදහස්වීම |
| CMA Sri Lanka | පදනම් අදියර සම්පූර්ණයෙන් නිදහස්වීම, මෙහෙයුම් අදියරෙහි විෂයයන් 3 ක් නිදහස්වීම |
| CIMA - UK | සහතික අදියර [Certificate level] සම්පූර්ණයෙන් නිදහස්වීම |
| ACCA - UK | දැනුම මොඩියුලය සම්පූර්ණයෙන් නිදහස්වීම, කුසලතා මොඩියුලයෙහි එක් විෂයයක් නිදහස්වීම |
| CIPM | ACHRM [Advanced Certificate in HRM] පාඨමාලාවෙන් නිදහස්වීම<br>CQHRM අදියර සඳහා ඇතුළත්වීමේ සුදුසුකම් ලැබීම |
| SLIATE | HNDA පාඨමාලාවෙහි පළමු වසර සම්පූර්ණයෙන් නිදහස්වීම |
| IPA Australia & IFA - UK | AAT Sri Lanka ආයතනයේ වෘත්තීය සාමාජිකයන්ට ඕස්ට්‍රේලියාවේ Institute of Public Accountants [IPA Australia] සහ එක්සත් රාජධානියේ Institute of Financial Accountants [IFA-UK] ආයතනයන්හි සාමාජිකත්වය ද ලබාගැනීමට හැකිය |
| Institute of Chartered Corporate Secretaries of Sri Lanka (ICCS) | AAT අවසන් විභාගය සමත්වූවන්ට සහ AAT ආයතනයේ සාමාජිකයන්ට පහත විෂයන්හි නිදහස්වීම් හිමිවේ.<br>Foundation Stage - A (විෂයයන් 02 ක් නිදහස් කර ඇත.)<br>Foundation Stage - B (සියලුම විෂයයන් 04ම නිදහස් කර ඇත.)<br>Professional Part II (බදුකරණය විෂය නිදහස් කර ඇත.) |

### විදේශීය විශ්වවිද්‍යාල

| | |
|---|---|
| NIBM ආයතනය Coventry විශ්ව විද්‍යාලය එක්සත් රාජධානිය සමග සහයෝගයෙන් | ඒ.ඒ.ටී. අවසන් අදියර සමත් සහ අවම වශයෙන් මාස තුනක වෘත්තීය පුහුණුවක් සහිත සිසුන් සම්මුඛ පරීක්ෂණයේදී සිදුකරන ඇගයීමෙන් සහ ඉංග්‍රීසි විභාගයෙන් සාර්ථක ශ්‍රේණියක් ලබා ගැනීමෙන්, වෘත්තීය ගණකාධිකරණය පිළිබඳ B.A. (ගෞරව) උපාධියේ ප්‍රථම අදියරෙන් නිදහස් වීම් ලබා ගැනීමට සුදුසුකම් ලබති. |
| BMS ආයතනය Northumbria විශ්වවිද්‍යාලය - එක්සත් රාජධානිය (UK) සමග සහයෝගයෙන් | ඒ.ඒ.ටී. අවසන් අදියර සමත් වී ඇති සිසුන්, එක්සත් රාජධානියේ (UK) නෝතම්බ්‍රියා විශ්වවිද්‍යාලය පවත්වන ගිණුම්කරණය සහ මූල්‍ය B.A. (ගෞරව) පාඨමාලාවේ සිව්වන මට්ටමට (එනම් දෙවන වසරට) පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, සුදුසුකම් ලබති.<br>(අ) ඒ.ඒ.ටී. පාඨමාලාව සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කර තිබීම හෝ<br>(ආ) නෝතම්බ්‍රියා විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබීම. |
| Saegis විශ්වවිද්‍යාලය Canterbury Christ Church විශ්වවිද්‍යාලය එක්සත් රාජධානිය සමග සහයෝගයෙන් | කළමනාකරණ මට්ටමේ අවම වසර දෙකක පළපුරුද්ද සහිත ඒ.ඒ.ටී. සාමාජිකයන්, Saegis Campus (පුද්ගලික) සමාගම මගින් පවත්වනු ලබන Canterbury Christ Church (එක්සත් රාජධානිය) විශ්ව විද්‍යාලයෙහි ව්‍යාපාර පරිපාලන විද්‍යාපති උපාධි පාඨමාලාවට (MBA) ඇතුළත් වීමට සුදුසුකම් ලබයි. |
| BCAS Campus, Southampton Solent විශ්වවිද්‍යාලය - එක්සත් රාජධානිය (UK) සමග සහයෝගයෙන් | ඉංග්‍රීසි මාධ්‍යයෙන් විභාග සම්පූර්ණ කරන ලද AAT අවසන් විභාග සමතුන්ට ගිණුම්කරණ හා මූල්‍ය ගෞරව උපාධිය (B.Sc. (Hons) Accounting & Finance) සඳහා අයදුම් කිරීමට ඉඩ ප්‍රස්ථාව ලැබේ. මෙම පාඨමාලාවට සම්බන්ධ වීමෙන් AAT විභාග සමතුන්ට වසරක කාලයක් තුළ ගෞරව උපාධියක් ලබා ගැනීමට හැකි වේ. |

**යුරෝපියන් සිටි විශ්ව විද්‍යාලය** (European City Campus) **- මැලේසියාවේ සිටි විශ්වවිද්‍යාලය** (City University) **සහ මධ්‍යම ඇමරිකානු කලාපයේ නිකරගුවා රාජ්‍යයේ පැසිෆික් විශ්වවිද්‍යාලය සමග සහයෝගයෙන්**

ඒ.ඒ.ටී. අවසන් විභාග සමතුන්ට අවසන් වසර පමණක් සම්පූර්ණ කිරීමෙන් පහත උපාධි ලබාගත හැක.

- ➔ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය (ගෞරව) - සිටි විශ්වවිද්‍යාලය, මැලේසියාව.
- ➔ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය - පැසිෆික් විශ්ව විද්‍යාලය, නිකොරගුවා, මධ්‍යම ඇමරිකාව.
- ➔ ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ උපාධිය - පැසිෆික් විශ්වවිද්‍යාලය, නිකරගුවා මධ්‍යම ඇමරිකාව.

SLIIT Academy (Pvt.) **Ltd. එක්සත් රාජධානියේ** Bedfordshire **විශ්වවිද්‍යාලය සමග සහයෝගයෙන්**

ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය පිළිබඳ සහතික කරන ලද (එනම් අ.පො.ස. සා/පෙළ ඉංග්‍රීසි භාෂා විෂයට අවම `C´ සාමාර්ථයක් තිබෙන) AAT අවසන් විභාග සමතුන්ට SLIIT Academy මගින් පිරිනමනු ලබන එක්සත් රාජධානියේ Bedfordshire විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ගෞරව උපාධියේ 2 වන වසරට පාර්ශවීය පිවිසුමක් හිමිවේ. (පළමු වසරේ අමතර මොඩියුල 2 ක් සම්පූර්ණ කිරීමෙන් පසු)

### දේශීය විශ්වවිද්‍යාල

| | |
|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | AAT අවසාන විභාගය සමත් වූවන්ට, පහත සඳහන් බාහිර උපාධිවලට ලියාපදිංචි වීමට ඉල්ලුම් කළ හැකිය<br>➔ වාණිජවේදී උපාධිය [B.Com.]<br>➔ ව්‍යාපාර පරිපාලන උපාධිය [B.Sc. - Business Administration]<br>➔ රාජ්‍ය පරිපාලන උපාධිය [B.Sc. - Public Administration] |
| කොළඹ විශ්වවිද්‍යාලය (කලමණාකරණ හා මූල්‍ය අධ්‍යයන අංශය) | අවසාන විභාගය සමත් වූවෙකුට ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමට ඉල්ලුම් කළ හැකිවේ |
| කැලණිය විශ්වවිද්‍යාලය | අවසාන විභාගය සමත් වූවන්ට, ශාස්ත්‍රවේදී (සාමාන්‍ය / විශේෂ) බාහිර උපාධිය සඳහා ලියාපදිංචි වීමට ඉල්ලුම් කළ හැකි වේ |
| විවෘත විශ්වවිද්‍යාලය | කළමනාකරණ ඩිප්ලෝමා විභාගයට ලියාපදිංචි වීමට තෝරා ගැනීමේ විභාගයට ඉල්ලුම් කළ හැකි වේ |
| වරලත් ගණකාධිකරණ ආයතනයේ SAB Campus | ඒ.ඒ.ටී. ශ්‍රී ලංකා ආයනයේ සාමාජිකයන් හට වරලත් ගණකාධිකාරී ආයතනයේ SAB Campus විසින් පිරිනමනු ලබන ව්‍යවහාරික ගිණුම්කරණ (සාමාන්‍ය) උපාධියේ පළමු අධ්‍යයන වාරයේ පළමු වසරේ විෂයයන් 6 ක් දෙවන අධ්‍යයන වාරයේ පළමු වසරෙහි විෂයන් 3 ක් සහිතව පාඨමාලා ඒකක 9 කින් නිදහස් කර ඇත. |

**වැඩිදුර පැහැදිලි කරගැනීම් : දුරකතන අංක - 0772 559 669 / 0112 559 669 (ස්වර්ණා හෝ දිල්හාරා හෝ ඩිශෝලිනි).**

**විද්‍යුත් තැපෑල - swarna@aatsl.lk / studentrelations@aatsl.lk**

**AAT ආයතනයේ නවතම තොරතුරු පිළිබදව යාවත්කාලීන වීමට AAT නිල Telegram නාලිකාව, Facebook පිටුව, වෙබ් අඩවිය, Youtube නාලිකාව සහ Instagram වෙත යොමුවන්න.**

**AAT ශිෂ්‍යභාවය අලුත් කර ඉක්මණින්ම AAT සුදුසුකම සම්පූර්ණ කිරීමට ආරාධනා!**

ඔබේ විශ්වාසී,

**ටිශාංග කුමාරසිංහ**
**ප්‍රධාන විධායක නිලධාරී**

### 2025 ක්‍රියාකාරී සිසුන් වෙනුවෙන්ම පිරිනැමෙන විශේෂ අවස්ථා

2025 වර්ෂයට ලියාපදිංචිය අලුත් කරන ඔබ වෙනුවෙන්ම ඔබේ දැනුම වර්ධනයට, විනෝදාස්වාදයට සහ ජාලගතවීම් උදෙසා වන විවිධ අවස්ථාවන් AAT ආයතනය විසින් සැලසුම් කරමින් පවතින අතර ශිෂ්‍යභාවය අලුත් කර ඒ සියල්ල භුක්ති විඳින ලෙසට අපි සිහිපත් කරමු.


## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

ඒ.ඒ.ටී. මධ්‍යස්ථානය, අංක 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

දුරකතන : 011 2 559 669 | වෙබ් : www.aatsl.lk

registration@aatsl.lk


ජාත්‍යන්තර පිළිගැනීම

IFAC International Federation of Accountants — CAPA Confederation of Asian and Pacific Accountants



**Gold Award** (Association & Societies Sector) for the 09th Consecutive Year (2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2021 | 2022-2023) National Business Excellence Awards 2023

**Gold Award** NGOs Category [including NPOs] in South Asian Sector] Annual Report Awards, Integrated Reporting Awards & SAARC Anniversary Awards for Corporate Disclosure 2022

**Gold Award** NPO Category [Including NGO] TAGS Award - Organized by CA Sri Lanka

**Merit Award** (Excellence in Corporate Social Responsibility) at the National Business Excellence Awards 2021

**Silver Award** (Medium Category) at the National Business Excellence Awards 2021

**Gold Award** CMA Excellence in Integrated Reporting Awards - 2023 Organized by CMA Sri Lanka

**Overall Merit Award** CMA Excellence in Integrated Reporting Awards - 2023 Organized by CMA Sri Lanka